සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **සිංහල භාෂාව හා සාහිත්‍යය II** කාලය පැය දෙකයි

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 80 කි.**

(01) i සිට x තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) පහන (ආ) පහණ

ii. පහත සඳහන් එක් එක් පදවල අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් ලියන්න.
(අ) බුරුත (ආ) ඌරා

iii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
සාම්ප්‍රධායික සමාජයන්හි නව දැනුම ලබා ගැනීම සඳහා විවිධ භාධක පැවතිණි.

iv. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරුන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) අද හෙට **නොවැස්සොත්** වගා පාළු වේවි.
(ආ) අපි උපරිම දස්කම් **දක්වමින්** ක්‍රීඩා කළෙමු.

v. පහත දැක්වෙන පදවල නාම ප්‍රකෘතිය වෙන් කොට දක්වන්න.
(අ) සිංහයා (ආ) පොත

vi. පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
(අ) යම්කිසි වචනයක මතුපිට අර්ථය ......................
(ආ) යම් කෙනෙකු වෙනුවට පෙනී සිටින්නා.........................

vii. පහත සඳහන් පාඨයේ තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙනම ලියන්න.
**අතුළ** කුසුම් විලසින් සැදෙන **තරුවැළ**
(අ) **අතුළ** (ආ) තරුවැළ

viii. පහත සඳහන් අර්ථ ප්‍රකාශවෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.
(අ) වැඩක් ගත නොහැකි දෙයක් දීම. (ආ) වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම.

ix. පහත වාක්‍ය **සදොස්** නම් **නිදොස්** කර නැවත ලියන්න.
(අ) අපේක්ෂකයන් බොහෝ දෙනෙක් තනතුරු සඳහා තේරී පත්වූහ.
(ආ) ශ්‍රී රාහුල මා හිමියන් පරෙවි සන්දේශය ලිවූහ.

x. පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු සිංහල වචන ලියන්න.
(අ) සකලයා (ආ) කුදහච්චා (ලකුණු 02 **x** 10 = 20යි)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර සම්බන්ධ කරමින් අධිවේගී මාර්ග ඉදිවේ. මේ නිසා ගමනාගමනයට පහසුවක් වී ඇත. අධිවේගී මාර්ග ඉදි කිරීම නිසා පාරිසරික වශයෙන් විශාල බලපෑම් ද ඇතිවේ. මේ නිසා පරිසර හානිය අවම කර ගනිමින් රටේ සංවර්ධනයට මාර්ග පද්ධතිය සංවර්ධනය කළ යුතුය.

(ආ) ජනශ්‍රැතිය හා ජනකවිය තුළින් අතීත පුරවැසියා පෝෂණය විය. එහෙත් වර්තමානයේ ඇති තාක්ෂණික මෙවලම් නිසා මිනිස් සිත දූෂණය වී ඇත. අපේක්ෂිත ජීවන රටාවට මැදිව ඇති වැඩිහිටියෝ තම බාල පරපුර ඒ මඟට කැඳවාගෙන යති. එහෙයින් තෘප්තිමත් ජීවිතයක් කරා දරුවා ගෙන යාමට අතීතයෙන් පාඩම් දැනගත යුතුයි.

(ඇ) පරිගණකය වර්තමාන ලෝකයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. ඇතැම් සංවර්ධිත රටවල ජනතාවට පරිගණකයේ සහාය නොමැතිව ජීවත් වීමට නොහැකි තත්ත්වයක් උද්ගත වෙමින් පවතී. කුඩා ඔරලෝසුවේ සිට ගුවන්ගමන් පාලනය වැනි සංකීර්ණ කාර්යයන් තෙක් පරිගණක භාවිතය පුළුල් වී ඇත. එහෙයින් රටේ යහපත උදෙසා පරිගණක දැනුම පිළිබඳ ව පාසල් දරුවන් මෙන් ම සමස්ත ප්‍රජාව ම දැනුවත් කිරීමේ කාලය දැන් එළැඹ ඇත.

(ඈ) රටක සංවර්ධනය ඇති කිරීමේදී කෘෂිකර්මාන්තය දියුණු කිරීම ඉතා වැදගත් වේ. අද වන විට සහල් පමණක් නොව බොහෝ ආහාර ද්‍රව්‍ය පිටරටවලින් ආනයනය කරයි. මෙසේ පිටරටවලින් ආහාර ගෙන්වීම ශ්‍රී ලංකාව වැනි රටකට සුදුසු නොවේ. අපේ රටේ භූමියෙන් ප්‍රයෝජන ගැනීමටත් සුරක්ෂිත ආහාර ලබා ගැනීමටත් කෘෂිකර්මාන්තය නගා සිටුවීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා සියලු ම පුරවැසියන්ගේ දායකත්වය අවශ්‍ය වේ.

(ලකුණු 25යි)

(03) පහත සඳහන් පාඨය වචන 55 - 60 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

රටක සැබෑ සංවර්ධනයක් ඇති වනුයේ එරට ජනතාවගේ නිර්මාණශීලීත්වය ඔප් නංවන අන්දමේ නිදහසක් භුක්ති විඳීමට ඉඩ සලසා ඇත්නම් පමණි. මහජනතාවගේ නිදහස මර්දනය කිරීමෙන් අංග සම්පූර්ණ සංවර්ධනයක් රටක ඇතිවෙතැයි පිළිගත නොහැකිය. රටක විධිමත් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට නම් ජනතාවගේ ගැඹුරු, හෘදයංගම වූ මහජන සහභාගිත්වයක් තිබිය යුතුය. බහු ජාතික සමාජයකට කුමන අන්දමේ දේශපාලනයක් හා නිදහස් මානව අයිතිවාසිකම් පද්ධතියක් ගැළපේද යන්න පර්යේෂණාත්මකව සොයා බැලිය යුතුය. අද ජාත්‍යන්තර චින්තකයන් ඇතුළු බොහෝ බුද්ධිමය සංවිධාන සංවර්ධනය යනු දේශපාලන සහභාගිත්වය, සමාජ සාධාරණත්වය හා ආර්ථික සංවර්ධනය මේ ත්‍රිවිධ සාධකයන්හි එකමුතුවක් බැව් පවසති. සමාජ සාධාරණත්වය ඉටුවන පරිදි අධ්‍යාපන ක්‍රමය සකස්වන විට එය සංවර්ධන කාර්යයෙහි ලා ඵලදායි අන්දමින් උපයෝගී කරගත හැකි වේ.

ඉහත කී සාධක අතරින් මෙරට සමාජ අරමුණු අබිබවා ගොස් තිබීම සංවර්ධනයේ සමතුලිත භාවය කෙරෙහි බල පෑ කරුණකි. මේ හේතුව නිසා ජීවිත අපේක්ෂා හා සාක්ෂරභාවය වැඩි වූ අතර සෞඛ්‍ය තත්ත්වය ද වැඩි දියුණු විය. එනමුදු මෙකී අංශයට ප්‍රමුඛතාව දෙනු ලැබීමෙන් සිදු වූයේ විශාලතම රැකියා ප්‍රශ්නයක් රටෙහි ඇතිවීමයි. රටේ ආර්ථික අරමුණු ජයගත නොහැකි වූයේත් ජනවාර්ගික ප්‍රශ්නයට මෙතෙක් විසඳුම් දීමට නොහැකි වූයේත් ඉහත කී හේතුව නිසයි. ජාතික සංවර්ධන කාර්යයේ දී වැදගත් කොට සැලකිය යුතු දෙයක් නම් සංවර්ධනයට ජනතා සහභාගීත්වය ලබා ගැනීමයි.

(ලකුණු 10යි)

(04) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

නැගී සිටිවු දැන් නිදිකත් හරිවු ලෝ
පහන් ව යේ ළා රිවිකැන් ඇදී යයි
දනන් කනේ ලා කියනා පරිද්දෙන්
හඬත් කුරුල්ලෝ තුරු හිස් සැදුම් දුන්

උදේ හිරේ ළා කැල්මෙන් වැදීමෙන්
රනින් අලෙව් දුන් සිතුවම් පටක් සේ
දිලේ නෙ රැක්මල් පල්ලෙන් සැදී ඊ
වටා සරත් මී මැස්සෝ සොයා මී

රැයක් ගෙවී අන් දවසක් උදා වී
අපේ වැඩත් දැන්ම පටන් ගනිම් හයි
නැගී උදාවක් නිම වා පහන් වී
දනෝ තමන්ගේ කෙත්වත් බලායෙත්

(i) කුරුල්ලන් ජනතාවට දුන් පණිවුඩය ලියන්න.
(ii) මී මැස්සන්ගේ හැසිරීම කවියාට පෙනී ඇත්තේ කෙසේද?
(iii) "නිදිකත් හරිවු" යන්නෙහි අදහස ලියන්න.
(iv) මිනිසුන්ගේ උද්‍යෝගිමත් භාවය දැක්වෙන පද්‍ය පාදය උපුටා ලියන්න.
(v) පද්‍ය පන්තිය ඇසුරෙන් අරුත් දක්වන්න.
(අ) රිවිකැන් (ආ) තුරුහිස්

(ලකුණු 10යි)

(05) ඔබේ ගම් ප්‍රදේශයේ ඩෙංගු උණ ශීඝ්‍රයෙන් පැතිර යමින් පවතී. ඊට ප්‍රධාන හේතුව වූයේ පරිසරයේ අපවිත්‍රතාවය යි. රැස්වීමක් පවත්වා ජනතාව දැනුවත් කිරීමෙන් මේ ගැටලුව විසඳා ගැනීමට හැකිවෙතැයි සෞඛ්‍යදාන සමිතිය අදහස් කරයි. එම රැස්වීමට පැමිණ ජනතාව දැනුවත් කරන ලෙස ඉල්ලමින් දිස්ත්‍රික් සෞඛ්‍ය අධිකාරිවරයාට යවන ලිපිය සකස් කරන්න.
සෞඛ්‍යදාන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත්ය.)

**නැතහොත්,**

සිරිපුර එක්සත් සුභසාධක සංගමයට ආධාර ලබා ගැනීම පිණිස 2018 අප්‍රේල් මස 06 වෙනි දින "සිරිපුර යොවුන් රඟහලේ" දී පියල් දමයන්තගේ "මහසයුර කැළඹෙයි" නාට්‍ය පෙන්වීමට සැලසුම් කර ඇත. පෙ.ව. 10.30 හා ප.ව. 2.30 දර්ශන වාර දෙකක් පැවැත්වෙන අතර පෙ.ව. 10.30 දර්ශනය පාසල් දරුවන්ට වෙන්කර ඇත.

පෙ.ව. 2.30 දර්ශනය නැරඹීමට පැමිණෙන ලෙස ආරාධනා කරමින් සිරිපුර ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. සංගමයේ ලේකම් සඳරු වැලිවත්ත ඔබ යැයි සිතන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15යි)

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**21 | S | III**

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 10 - 2018

**විභාග අංකය ................................... සිංහල භාෂාව හා සාහිත්‍යය- III කාලය පැය 02 යි.**

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.**
- **1,2,3,4, ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්න වලින් එක් ප්‍රශ්නයකටත් පිළිතුරු සපයන්න.**

(01) **(i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න.
කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නැගීමට අනුග්‍රහය දැක්වූ ඇමතිවරයා කවුද?
(ආ) ජාතක කතා අතර දීර්ඝතම ජාතක කතාව වන්නේ කුමක්ද?

(ii) "රජ්ජුරුවන්ට පටහැනි වීම නම් යුක්ත නොවෙයි."
(අ) මෙසේ සිතුවේ කවුද?
(ආ) මෙම පාඨය ඇතුළත් පාඩමේ නම කුමක්ද?

(iii) (අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ කුමක්ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නැගුණ පසුව රචනා වූ ජාතක කතා පොතක් නම් කරන්න.

(iv) සිංහල ජාතක කතා පොතෙහි දක්නට ලැබෙන ලක්ෂණ 2ක් ලියන්න.

(v) "පින්වත්නි, නොයව; මම ගොවියා පුතු නොවැන්දෙමි."
(අ) මෙහි "පින්වත්නි" යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කාටද?
(ආ) "ගොවියා පුතු" යනු කවුද?

(vi) (අ) ගුත්තිල කාව්‍ය රචනා කළේ කවුද?
(ආ) ගුත්තිල කාව්‍යයෙහි සඳහන් පද්‍ය ගණන කීයද?

(vii) "අප බෝසතුන් මිස
අනිකෙකු නොම අසන ලෙස"
මෙම පද්‍යයෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(viii) (අ) මුසිල ජීවත් වූයේ කිනම් පුරවරයක ද?
(ආ) ඔහු වීණා වාදනය හැදෑරීමේ අරමුණින් පැමිණියේ කිනම් නුවරට ද?

(ix) (අ) ගුත්තිල කාව්‍යයේ සඳහන් ආකාරයට ගුත්තිල පඬිතුමාට ප්‍රතිවාදියා පැරදවීමට උදව් කළේ කවුද?
(ආ) වීණා වාදනය අතරතුර අලංකාර රංගනයක් ඉදිරිපත් කළේ කවරහුද?

(x) (අ) ගුත්තිල කාව්‍ය රචනා වූයේ කිනම් යුගයකදී ද?
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුද?

(ලකුණු 02 x 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "යමෙක් ඊ දණ්ඩක බැඳ විද පී පතක් දුටුයේ වී නම් වහා ගෙන්වුත් මට දෙව"
(අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුද? එසේ ප්‍රකාශ කළේ කාටද?
(ආ) මේ ආකාරයෙන් පණිවිඩ ලබා ගන්නට හේතු වූ කාරණය කුමක්ද?

(ii) " අපි දෙන්නමෝ ම පණ්ඩිතවරුම්හ. තොප නිසා අවුත් මෙතෙක් කල් මෙතැන වසන අපට තොපි අමුතු පඬුරක් පමණවත් නොඑවූ විරූය"
(අ) මෙහි සඳහන් පණ්ඩිතවරු දෙදෙනාගේ නම් ලියන්න.
(ආ) මෙම අවස්ථාව හා සම්බන්ධ සිදුවීම කෙටියෙන් ලියන්න.

(iii) "මැණියන් වහන්ස, මා දන්නේ මෙපමණක් ම ය. ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දක්නා සේක් වී නම් පසිඳුව මැනව."

(අ) මෙහි සඳහන් වන්නේ කාගේ මව පිළිබඳවද? ඇගේ නම කුමක්ද?

(ආ) එහිදී පසිඳලන්නේ කුමන ගැටලුවක්ද?

(iv) <u>පන්සිළු</u> වීණා නද පසු බැස්වූ
මත් පිනවන වෙණ නදයෙන් තොස්වූ
නන් දන කැන් දුටුව ද බිය සිස් වූ
<u>මින් රළ</u> <u>වුත්</u> ගං වෙරළට රැස්වූ

(අ) මෙහි ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම කවියේ සමස්ත අර්ථය සරල බසින් ලියන්න.

(v) පුන් මදාරා මල් දමින් මුදු
දිගු සුනිල් වරලස ගොතා
මන් මදා කිතුලිය ලෙසින් උර
තුර සරා දිලි මුතු ලතා

(අ) මෙහි සඳහන් කාන්තාවන්ගේ හිස සරසා තිබුණේ කෙසේද?

(ආ) 'කිතුලිය' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 04 x 05 = 20)

(03) (i) කෙටි සංවාද භාවිතය.

(ii) සංකල්ප රූප මැවීමට උචිත භාෂාව භාවිත කිරීම, උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය, එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්,**

(I) පරාර්ථය උදෙසා කටයුතු කරන චරිත.

(ii) ආත්මාර්ථය උදෙසා කටයුතු කරන චරිත.
මනා ලෙස සංයෝග කරමින් රචනා කිරීම නිසා උම්මග්ග ජාතකය සාර්ථකත්වයට පත්ව ඇති අයුරු මහෞෂධ හා කේවට්ට චරිත ඇසුරින් උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

(04) (i) ගුත්තිල පඬිවරයාගේ කීර්තිය පැතිරීම.

(ii) මූසිලගේ අපකීර්තිය පැතිරීම මනා ලෙස නිරූපණය කිරීමට වීණා වාදන තරගය උපයෝගී කර ගැනීම රචකයාගේ දක්ෂතාවයයි. එක් කොටසකට උදාහරණ 2ක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්,**

(i) මිනිස් හැසිරීම් රටා

(ii) සත්ත්ව හැසිරීම් රටා උපයෝගී කර ගනිමින් වීණා වාදනයේ මිහිරි බව ධ්වනිතාර්ථවත් කිරීමට කතුවරයා ගත් උත්සාහය එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් පහදන්න. (ලකුණු 15)

(05) බෝධිසත්වයන් වහන්සේගේ උත්තරීතර බව උම්මග්ග ජාතකයේ එන මහෞෂධ පඬිතුමාගේ චරිතය තුළින් ඉදිරිපත් කර ඇති ආකාරය උදාහරණ 3ක් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(06) "අර්ථය තිව්‍ර වන්නේ ශබ්දය ඒ හා ගැළපෙන ලෙස අනුගත කළහොත් පමණි." ගුත්තිල කාව්‍යය ඇසුරෙන් උදාහරණ 3ක් දක්වමින් විමසන්න.

(ලකුණු 10)

(07) ගුත්තිල කාව්‍යය සාර්ථක නිර්මාණයක් බවට පත් කිරීම සඳහා කතුවරයා යොදාගෙන ඇති කාව්‍යෝපක්‍රම උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

***

**පළමුවාර පරීක්ෂණය 2018**
10 ශ්‍රේණිය
සිංහල - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - iv | (11) - iv | (21) - iv | (31) - iv |
| (2) - iii | (12) - iii | (22) - ii | (32) - iv |
| (3) - i | (13) - iv | (23) - iv | (33) - iii |
| (4) - ii | (14) - iv | (24) - i | (34) - i |
| (5) - iii | (15) - ii | (25) - i | (35) - iii |
| (6) - iv | (16) - i | (26) - ii | (36) - iii |
| (7) - iii | (17) - i | (27) - ii | (37) - i |
| (8) - i | (18) - iii | (28) - ii | (38) - ii |
| (9) - ii | (19) - ii | (29) - iv | (39) - i |
| (10) - i | (20) - iii | (30) - iii | (40) - iii |

## II පත්‍රය

01. (අ) I (අ) පහන - දල්වන පහන (ආ) පහණ - පාෂාණ
II පාපිල්ල, පාපිල්ල (ආ) ගයනුකිත්ත, ඇලපිල්ල
III සාම්ප්‍රදායික, බාධක ( වාක්‍යම ලියා තිබුනද නිවැරදිය.)
Iv (අ) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා (ආ) මිශ්‍ර ක්‍රියා / මුසුකිරිය
v (අ) සිංහ (ආ) පොත්
vi (අ) වාච්‍යාර්ථය (ආ) නියෝජිතයා
vii (අ) අතුළ - අතුරන ලද (ආ) තරුවැළ - තරු සමූහය
viii (අ) බල්ලන්ට ලෙලි පොල් දුන්නා වගේ (ආ) දී කිරට බළල්ලුත් සාක්කිලු.
ix (අ) අපේක්ෂකයෝ බොහෝ දෙනෙක් තනතුරු සඳහා තේරී පත්වූහ.
(ආ) ශ්‍රී රාහුල හිමියෝ පරෙවි සන්දේශය ලිවූහ.
x (අ) කුරුල්ලා (ආ) නිදාගත්තා. (ලකුණු 2 බැගින් 20යි.)

02. රචනය - (මුළු ලකුණු 25යි)
1. සාරවත්භාවය, මාතෘකාවද ඇතුළත්ව (ලකුණු 08)
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය (ලකුණු 12)
3. ශිල්පීය දක්ෂතාවය සහ ඡේද බෙදා ලිවීම. (ලකුණු 05)

03. සාරාංශය - (මුළු ලකුණු 10යි)
1. අන්තර්ගතය, ප්‍රධාන අදහස් සඳහා (ලකුණු 06)
2. වචන ගණන (වචන 55 - 60 අතර) ලකුණු (ලකුණු 02)
3. ශිල්පීය දක්ෂතා, (වියරණ, අත් අකුරු, විරාම ලකුණු) (ලකුණු 02)

04. අවබෝධ හැකියාව. (මුළු ලකුණු 10යි)
(i) නින්දෙන් අවදිවන්න, (ඉර පායා ඇති නිසා) (ලකුණු 02)
(ii) මල් පැණි සොයා ගස් වටේ සැරිසරන්නාක් මෙන් (ලකුණු 02)
(iii) නින්දෙන් පිබිදෙන්න. / නින්දෙන් අවදිවන්න.
නින්ද නැමැති කාන්තාව අත්හරින්න. (ලකුණු 02)
(iv) ''අපේ වැඩත් දැන්ම පටන් ගනුම්හයි'' (ලකුණු 02)
(v) (අ) රිවිකැන් - හිරුරැස් / සූර්ය රශ්මිය /හිරුකිරණ
(ආ) තුරුහිස් - ගස් මුදුන් / තුරුමත (ලකුණු 02)

05. රාජකාරී ලිපිය (මුළු ලකුණු 15යි)
1. ආකෘතිය සඳහා (ලකුණු 04)
2. අන්තර්ගතය සඳහා (ලකුණු 08)
3. ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 03)

**නැතහොත්,**

ආරාධනා පත්‍රය (මුළු ලකුණු 15 යි)
1. ආකෘතිය සඳහා (ලකුණු 05)
2. අන්තර්ගතය සඳහා (ලකුණු 07)
3. ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 03)

## III පත්‍රය

1. (i) (අ) වීරසිංහ ප්‍රතිරාජ ඇමති (ආ) උම්මග්ග ජාතකය
(ii) (ආ) කේවට්ට බමුණා (ආ) සතර කන් මන්ත්‍රණය
(iii) (අ) මහෞෂධ පණ්ඩිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීමට.
(ආ) උම්මග්ග ජාතකය / එළු උමංදාව / උම්මදන්ති ජාතකය
(iv) ජාතක කතා ස්වල්පයක් දක්නට ලැබීම / ව්‍යාකරණ කොටස දක්නට නොලැබීම / අතීත කතාව අඛණ්ඩව ඉදිරිපත් කිරීම.
(v) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමාගේ සේනාව. (ආ) මහෞෂධ පණ්ඩිතුමා / බෝසතාණන් වහන්සේ
(vi) (අ) වැත්තෑවේ හිමියන් (ආ) පද්‍ය 511
(vii) සුර රජ සිට අහස
තතක් සිදුව යි කීය එවිගස
(viii) (අ) උදේනි පුරයේ (ආ) බරණැස් නුවරට
(ix) (අ) සක්විති රජු / ශක්‍ර දේවේන්ද්‍රයා (ආ) දෙවඟනන් / සුරඟනන්
(x) (අ) කෝට්ටේ යුගය (ආ) සලාවත ජයපාල මැතිඳුන්

2. (i) (අ) මහෞෂධ පණ්ඩිතුමා, මියුලු නුවර වැසියන්ට
(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජු විසින් මියුලු නුවර වටලා එය අත්පත් තර ගැනීමට උත්සාහ දරමින් සිටි නිසා.
(ii) (අ) මහෞෂධ පණ්ඩිතුමා, කේවට්ට බමුණා
(ආ) කේවට්ට බමුණා ධර්ම යුද්ධය ප්‍රකාශයට පත් කළ විට, එම ස්ථානයට මහෞෂධ පණ්ඩිතුමා ප්‍රමාද වී පැමිණි අවස්ථාවේ.
(iii) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මව, තලතා දේවිය
(ආ) ගඟෙන් එතෙර කළ මිනිසාට ගඟෙන් එතෙර වූ මිනිසා විසින් ලබා දෙන ත්‍යාගය පිළිබඳව ගැටලුව.
(iv) (අ) පන්සිළු - පංච ශිඛ / ශක්‍ර දෙවියන්ගේ වීණා වාදකයා/ මීන් රළ - මාළු රංචු
(ආ) පංච ශිඛගේ වීණා නාදය පසු බැස් වූ සිත පිනවන වීණා නාදයේ සතුටට පැමිණි නොයෙක් ජන සමූහයන් දැකත් බියක් නැති වූ මාළු රංචු අවුත් ගං ඉවුර සමීපයට රැස් වූහ.
(iv) (අ) කෙස් කලඹ ගොතා පිපුණු මදාරා මල් වැල් ගවසා
(ආ) කීර්ති ලතාව

3. (i) කෙටි සංවාද භාවිතය.
''දේවයන් වහන්ස, කොට පිය යුතු කතාවෙක් ඇතැ''යි කීය. රජ්ජුරුවෝ ''කියව ආචාරිණී'' යැයි කීහ. දේවයන් වහන්ස, ඇතුළු නුවරදී රහස් කියන්ට නොපිළිවන. මඟුල් උයනට යම්හ''යි කීහ.

''පුත, මා විසින් කුමක් කළ මනා දැයි'' කීහ. දේවයන් වහන්ස, කේවට්ටයා මැණිකකින් වඤ්චා කරනු කැමැත්තෙමි.''

(ii) සංකල්ප රූප මැවීම.

★ සතර කන් මන්ත්‍රණය පවත්වන අවස්ථාව.
රජ්ජුරුවෝ බමුණානන්ට, කිය යුතු රහස් කියව ආචාරිනී''යි කීහ.
දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ කන මැතට නමාලුව මැනව.''

★ සාල්ලෙක ලා ලා පාතට බානා කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඩක් හෙළා කිමෙක්දැයි කට දල්වාගෙන උඩ බැලුව තැනැත්තවුන්ගේ මුඛයේ නැවත වර්චස් පිඩක් හෙළා.''

★ සතර කන් මන්ත්‍රණය බිඳ දමන අවස්ථාව

- තොපගේ අහිත ශබ්දයෙන් ම උන් භය ගන්වා
සියලු රා මස් පිරූ සැළවල් බිඳ තු තු කොට පියා.....''

★ මියලු නුවර වටලෑම සඳහා යෙදූ උපක්‍රම

★ ධර්ම යුද්ධය පැවැත්වූ අවස්ථාව

- නැඟී සිටුව.. ආචාරිනී, නැඟී සිටුව.. ආචාරිනී, මම බාලයෙමි, තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි.

මා නො වඳුව''යි කිය කියා මුඛය හා සමඟ නලළ පෙරළ - පෙරළා බිම උලා රත්වද මලක් සේ ලේ හා පස් වකා

**නැතහොත්,**

03. i. - මහෞෂධ පඬිතුමා

''පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයට කළ මනා සත්කාර කොට හෙවත් මීයෙන් හැනු විලද කවා , මී පැන් පොවා, බෙත් තෙලින් පියා සගළ මැඩ මොලොක් ඇතිරිලි අතුරන ලද රන් මැදිරියෙහි සතප්පා, කේවට්ටය මා මහෞෂධ පණ්ඩිත බවම නොදනිතියි සිතමි.''

''මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත්වැ හින්ද දීම මෙතෙක් රජ දරුවන් මිය යාම යුක්ත නොවන්නේය. උනට මා පිටුවහල් වුව මැනවැයි සිතා...

... පිපාසා ඇති එකකුට පැන් පුවහොත් මුත් ඒ පිපාසය නොසිඳෙන්නා සේ ද රජ්ජුවනට මා මුත් අනෙක් පිළිසරණක් නැති රජ්ජුරුවන් අස්වසාලමි''...

- ★ ජීවිත හානියකින් තොරව සියලු යුද්ධෝපායයන් ජයගත් ආකාරය සඳහන්ව තිබීම.

ii. ★ තම වාසිය උදෙසා රජුට වැරදි උපදෙස් ලබා දීම.

''මෙබඳු සම්පත් දුන් රජ්ජුරුවන් සියලු දඹදිවට අගරජ කළොත් යහපත එසේ වුවහොත් මමත් අග්‍ර පුරෝහිත වෙමි.''

- ★ සතර කන් මන්ත්‍රණය පැවැත්වීම - එක් සියයක් රජවරු මැරීමට යෙදූ උපාය ''දේවයන් වහන්ස, මේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණය නම් වෙයි. අනෙක් කෙනෙකුන් දැක නොහැක්කේය.''

- ★ මියලු නුවර වටලෑම සඳහා යෙදූ උපක්‍රම
  - ජලය නැවැත්වීම
  - ධාන්‍ය නැවැත්වීම
  - දර නැවැත්වීම

04. i. ගුත්තිල පඬිවරයාගේ කීර්තිය පැතිරීම.

'තත මතු ද සින්දේ - පද්‍යය (9)
සුන් එ තතින් එ සඟ - පද්‍යය (10)
දිය දිය ගොස පළ කරමින් සැපැමිණි - පද්‍යය (14)

ii. මූසිලගේ අපකීර්තිය පැතිරීම.

කෙලෙහි ගුණ සින්දේ - පද්‍යය (11)
අණුවණකම් කෙළේ - පද්‍යය (12)

**නැතහොත්,**

i. මිනිස් හැසිරීම් රටා

නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ පද්‍යය (17)
මන මත් කරවන දන මුළු දෙරණා'' පද්‍යය (18)

ii. සත්ත්ව හැසිරීම් රටා

වර වෙණ නද අසමින් සිත සතොසිනි - පද්‍යය (20)
යොදා සවන් වෙණ නද රස සුලබව - පද්‍යය (21)

22, 23, 24, 25, 26, 27 යන පද්‍යයන්ගෙන් ඕනෑම උදාහරණ දෙකක් යොදා තිබීම.

- ★ (3, 4 ප්‍රශ්න සඳහා මෙම නිදසුන්වලට අමතරව සුදුසු නිදසුන් සඳහා ලකුණු ලබා දෙන්න)

- ★ 5, 6, 7 ප්‍රශ්න සඳහා නිදසුන් තුනක් දක්වමින් ලියා ඇති සුදුසු පිළිතුරකට නියමිත ලකුණු ලබා දෙන්න.